(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 186.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2017 අගෝස්තු මස 08 වැනි අඟහරුවාදා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1.

65/'15

ගරු බුද්ධික පතිරණ මහතා,— විදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල ආරක්ෂක උපදේශක තනතුර සඳහා නිලධාරීන් පත් කිරීමේදී සලකා බලන සුදුසුකම් කවරේද;

(ii) ආරක්ෂක උපදේශක තනතුරෙහි කාර්යභාරයන් කවරේද;

(iii) ඔවුන්ගේ සේවා කාලය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මේ වනවිට විදේශයන්හි ශ්‍රී ලංකා දූත මණ්ඩල කාර්යාලවල සේවය කරන ආරක්ෂක උපදේශකයන්ගේ නම් කවරේද;

(ii) ඔවුන් එම තනතුරු සඳහා පත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බ්‍රිගේඩියර් දේශප්‍රිය ගුණවර්ධන මහතා තුර්කියේ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ආරක්ෂක උපදේශක වශයෙන් පත් කරන ලද දිනය කවරේද;

(ii) වැඩ තහනමට ලක් වූ නිලධාරියෙකුට මෙවැනි තනතුරක් දැරීමට නීතිමය ප්‍රතිපාදන තිබේද;

(iii) එසේ නම්, එම නීති ප්‍රතිපාදන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2.

1115/'16

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ ටොරින්ටන් චතුරශ්‍රය, නාරාහේන්පිට ආදී ප්‍රදේශවල රාජ්‍ය හා පෞද්ගලික කාර්යාල රාශියක් පිහිටා ඇති බවත්;

(ii) එම ප්‍රදේශ හරහා ධාවනය වන මාර්ග අංක 173 මට්ටක්කුලිය නුගේගොඩ සහ මාර්ග අංක 115 ටොරින්ටන් හරහා පිටකොටුව නුගේගොඩ යන ගමන් මාර්ගවල දැනට කිසිදු ලංගම බස් රථයක් හෝ ධාවනය නොවන බවත්;

(iii) ඒ හේතුවෙන් එම මාර්ගවල ගමන් ගන්නා සාමාන්‍ය මගී ජනතාව මෙන්ම, කාර්යාල සේවකයන් දැඩි ප්‍රවාහන දුෂ්කරතාවයන්ට මුහුණ පා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මාර්ග අංක 173 සහ 115 යන බස් ගමන් මාර්ගවල අවම වශයෙන් එක් ලංගම බස්රථයක්වත් ධාවනය කරවීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3.

1266/'16

ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා,— නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) එල්.ටී. ටී. ඊ. ත්‍රස්තවාදීන් විසින් නැගෙනහිර පළාතේ පොලිස් ස්ථාන පහක් ඉලක්කකර ප්‍රහාරයක් සිදු කළ දිනය කවරේද;

(ii) එහිදී මියගිය පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iii) එම ප්‍රහාරයේදී අතුරුදහන් වූ පොලිස් නිලධාරින් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත ප්‍රහාරයෙන් සිදු වූ දේපළ හානිය පිළිබඳ තක්සේරුවක් කර තිබේ නම්, එය කොපමණද;

(v) එම විනාශයට වගකිව යුතු වූ ත්‍රස්තවාදීන් අත්අඩංගුවට ගෙන තිබේද;

(vi) අදාළ ප්‍රහාරයට වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව නීතිමය පියවර ගෙන තිබේද;

(vii) මෙම සිද්ධිය සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4.

1362/'16

ගරු ඩලස් අලහප්පෙරුම මහතා,— සංවර්ධන කාර්යභාර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල් ගෙවීම සඳහා ලියාපදිංචි වී ඇති මාතර දිස්ත්‍රික්කයේ පෞද්ගලික ආයතන සංඛ්‍යාව කවරේද;

(ii) එම ආයතනවල නම් කවරේද;

(iii) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදලේ සාමාජිකත්වය ලබා ඇති මාතර දිස්ත්‍රික්කයේ සේවක සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල සඳහා ලියාපදිංචි වීමට පැවතිය යුතු අවම අවශ්‍යතාවයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5.

1368/'16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මෑතකදී උසස් කරන ලද තම්පිලුවිල් මධ්‍ය මහා විද්‍යාලය ඇතුළුව ජාතික පාසල් අටක් නැගෙනහිර පළාතේ, අම්පාර දිස්ත්‍රික්කයේ, කල්මුනේ අධ්‍යාපන කලාපයේ තිබෙන බවත්;

(ii) මේ වනවිටත් එම ජාතික පාසැල් සඳහා ස්ථිර විදුහල්පතිවරුන් පත්කර නොමැති බවත්;

(iii) ඉහත පාසල්වල ස්ථිර විදුහල්පතිවරුන් සිටින බවට වැරදි තොරතුරු අධ්‍යාපන අමාත්‍යාංශයට ලබා දී ඇති බවත්;

(iv) අධ්‍යාපන අමාත්‍යාංශයේ නිසි අධීක්ෂණයක් නොමැතිව ඉහත පාසල් ක්‍රියාත්මක වනබවට ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන්ගේ සංගමය චෝදනා නගා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ජාතික පාසැල්වල විදුහල්පතිවරු අනිවාර්යයෙන්ම උපාධිධාරීන් විය යුතු බවට වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි, ඉහත සඳහන් පාසල්වලට සුදුසු ස්ථිර විදුහල්පතිවරුන් පත්කිරීමට කටයුතු කරන්නේද;

(ii) එසේ නම්, එය ක්‍රියාත්මක වන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

6.

1389/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— ග්‍රාමීය ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැයෙහි අංක 141 යෝජනාවට අනුව, දේශීය කිරි නිෂ්පාදකයන් සඳහා පැකැට්ටුවකට රුපියල් 30/-ක සහනාධාරයක් ලබා දීමට යෝජනා කළ බව පිළිගන්නේද;

(ii) ඉහත කිරි නිෂ්පාදන සහනාධාරය වෙනුවෙන්, අයවැයෙන් වෙන් කළ රුපියල් මිලියන 1000ක මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය වූ අයුරු පැහැදිලි කරන්නේද;

(iii) කිරි නිෂ්පාදන සහනාධාරය කවර අමාත්‍යාංශයක් හරහා කවර පුද්ගලයන් හෝ ආයතන වෙත ලබා දුන්නේද;

(iv) වර්ෂ 2005 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදනය, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් ලීටර් මිලියන කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

7.

1393/'16

ගරු වාසුදේව නානායක්කාර මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කළුතර සහ වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයන්හි ගොවීන්, පොහොර සහනාධාරය ලබා ගැනීමට පැමිණි අවස්ථාවේ සහනාධාර ඉල්ලුම්පත සමඟ ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඉදිරිපත් කළ යුතු බව අදාළ නිලධාරියා පවසා ඇති බවත්;

(ii) ගොවීන් වැඩි පිරිසකට ජාතික හැඳුනුම්පත් නොමැති බව පැවසූ විට හැඳුනුම්පතේ පිටපතක් අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු බව සඳහන් කරමින් චක්‍රලේඛයක් එවා ඇති බව දැනුම් දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) එම ප්‍රදේශයේ ගොවීන් සතු වැඩිහිටි හැඳුනුම්පත්, ගමන් බලපත් හා රියදුරු බලපත් ජාතික හැඳුනුම්පත් වෙනුවට භාර ගන්නා ලෙස නිලධාරීන්ට උපදෙස් ලබාදීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

8.

1507/'17

ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයේදී රජය ලබා ගත් මුළු ණයවල වටිනාකම කොපමණද;

(ii) 2016 වර්ෂයේදී ලබා ගත් ණය සඳහා ගෙවිය යුතු බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය කොපමණද;

(iii) වර්ෂ 2014 සහ 2015 ට සාපේක්ෂව, 2016 වර්ෂයේදී බර තැබූ සාමාන්‍ය පොලී අනුපාතය කොපමණ අගයකින් වෙනස් වී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

9.

1560/'17

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමූපකාර තොග වෙළඳ සංස්ථාව විසින් ආරම්භ කරන ලද "ගමට සවිය - සතොස බඩිය" ජංගම අලෙවි වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක වන්නේද;

(ii) මෙම ව්‍යාපෘතිය සඳහා යොදවන ලද වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) මෙම වැඩසටහන ක්‍රියාත්මක වූ කාලය කොපමණද;

(iv) මේ සඳහා දරන ලද මුළු වියදම පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කරන්නේද;

(v) මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට පෙර නිසි ශක්‍යතා අධ්‍යයනයක් සිදු කර තිබේද;

(vi) එසේ නොමැති නම්, ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ අවශ්‍යතාවය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

10.

1569/'17

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, තෝප්පූර් ක්‍රීඩාපිටිය සංවර්ධනය කිරීම සඳහා මුදල් වෙන් කරන ලද මූලාශ්‍ර කවරේද;

(ii) එම එක් එක් මූලාශ්‍රයෙන් වෙන් කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඒ සඳහා වැය වූ සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාපිටිය 2017 ජනවාරි මාසයේ විවෘත කළ බවත්;

(ii) එම සමරු ඵලකයේ ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසයේ පාක්ෂිකයන්ගේ නම් පමණක් සඳහන් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මෙම නම් සඳහන් කර ඇති පදනම කවරේද;

(ii) රජය නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ පළාත් සභා මන්ත්‍රීවරයන් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ සිටියදී, ඔවුන්ගේ නම්, මෙම සමරු ඵලකයේ ඇතුළත් නොකිරීමට හේතු කවරේද;

(iii) මෙම ක්‍රීඩාපිටියට තබා ඇති නම සම්බන්ධයෙන් අදාළ ක්‍රියාපටිපාටි අනුගමනය කර තිබේද;

(iv) රජයේ මුදලින් කරනු ලබන සංවර්ධන කටයුතුවලදී එක් පක්ෂයකට පමණක් ප්‍රමුඛතාවය ලබාදී ප්‍රචාරය ලබාදීම යහපාලනයේ ලක්ෂණයක් ලෙස පිළිගන්නේද;

(v) මෙම වරද නිවැරදි කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

11.

1574/'17

ගරු බිමල් රත්නායක මහතා,— උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය ආසන්නතම අධ්‍යයන වර්ෂ 5 තුළදී රාජ්‍ය විශ්වවිද්‍යාලවලට බඳවා ගනු ලැබූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව අතරින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ලබා දුන් ශිෂ්‍ය සංඛ්‍යාව;

(ii) දැනට මහපොළ ශිෂ්‍යත්වයක් වෙනුවෙන් මාසිකව ගෙවන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීමේදී කුසලතාවය මත (on merit basis) ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා සිසුන් තෝරාගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) පසුගිය ආසන්නතම අධ්‍යයන වර්ෂ 5 තුළදී, ඉහත (i)හි දක්වා ඇති පරිදි ජීව විද්‍යා, ගණිත, වාණිජ සහ කලා විෂය ධාරාවන් වෙනුවෙන් කුසලතාවය මත මහපොළ ශිෂ්‍යත්ව ලබාදුන් ශිෂ්‍ය සංඛ්‍යාව, අධ්‍යයන වර්ෂය හා විෂය ධාරාව අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ඉහත අධ්‍යයන වර්ෂ 5 තුළ දී ඉහත (ii)හි සඳහන් සිසුන් අතරින් ඒ ඒ විෂය ධාරාවන් අනුව, අවම සුදුසුකම් ලැබූ ශිෂ්‍යයන් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව අදාළ දිස්ත්‍රික් කුසලතාව (District Rank) සහ දිවයිනේ කුසලතාවය (Island Rank) අධ්‍යයන වර්ෂය සහ විෂය ධාරාව අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

12.

1673/'17

ගරු සෙය්යිඩ් අලී සාහීර් මවුලානා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ II වන පන්තියේ නිලධාරියෙකු වන ඒ. එල්. එම්. මුක්තාර් මහතා, අම්පාර කලාපයේ නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ලෙස කටයුතු කරන බවත්;

(ii) අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරයා ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ මුක්තාර් මහතාට වඩා කණිෂ්ඨ නිලධාරියෙකු බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහළ ශ්‍රේණිධාරී ජ්‍යෙෂ්ඨ නිලධාරියකුහට කණිෂ්ඨ නිලධාරියෙකු යටතේ සේවය කිරීමට ඉඩ දෙන්නේද;

(ii) මුක්තාර් මහතා සිය ශ්‍රේණියට සහ ජ්‍යෙෂ්ඨත්වයට සරිලන තනතුරකට මාරු කරමින් හෝ අම්පාර කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයා ලෙස මුක්තාර් මහතාට වඩා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කරමින් මෙම විෂමතාව නිවැරදි කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන්නේද;

(iii) එසේ නම්, කවර දිනයකදීද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

13.

1748/’17

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,— ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වෙච්ඡා ග්‍රාම නිලධාරී පුරප්පාඩු පිරවීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(ii) විශ්‍රාමික ග්‍රාම නිලධාරිවරයන් සඳහා රජයේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සේවය කරන ග්‍රාම නිලධාරින්ගේ ස්ථාන (වසම්) මාරු කළ හැකිද;

(iv) ග්‍රාම නිලධාරිවරයෙකුට එක් වසමක සේවය කළ හැකි කාලය වසර කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

14.

1369/’16

ගරු ඩග්ලස් දේවානන්ද මහතා,— බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ, වවුනියාව දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඕමන්තෙයි හන්දියට නැගෙනහිරින් කිලෝමීටර් 7ක් දුරින්, ඉලමරුදන්කුලම ගම්මානයත්, එතැන් සිට කිලෝමීටර් 3ක් දුරින් සේමමඩු ගම්මානයත් පිහිටා ඇති බවත්;

(ii) යුදමය තත්ත්වයට පෙර මෙම ගම්මානවල පවුල් 500ක් ජීවත් වූ අතර යුදමය තත්ත්වය අවසන්වීමෙන් පසු මේ වනවිට ඉලමරුදන්කුලම ගම්මානයේ පවුල් 19ක්ද, සේමමඩු ගම්මානයේ පවුල් 65ක්ද ජීවත්වන බවත්;

(iii) මෙම ගම්මානවල යුදමය තත්ත්වයට පෙර අක්කර 1100 ක් පමණ වූ බිම් ප්‍රදේශයක වගා කටයුතු සිදුවූ අතර වර්තමානයේ වන අලි තර්ජන හේතුවෙන් ගොවිතැන් කිරීමට නොහැකි තත්ත්වයක් උදා වී ඇති බවත්;

(iv) මෙම ජනතාව වෙනුවෙන් කිසිදු නිවාස යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක නොවූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉලමරුදන්කුලම් සහ සේමමඩු ගම්මානවල ජීවත්වන ජනතාවගේ සුභසිද්ධිය උදෙසා මේ වනවිට ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘති කවරේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ව්‍යාපෘති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

15.

1390/'16

ගරු බන්දුල ගුණවර්ධන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 අයවැය යෝජනා අංක 136ට අනුව, වී ගොවීන් සඳහා වර්ෂයකට රුපියල් 25,000/-ක උපරිමයකට යටත්ව නිකුත් කළ පොහොර සහනාධාරය ලබා ගත් පුද්ගලයන් සහ එම එක් එක් පුද්ගලයාට ලබා දුන් මූල්‍ය ප්‍රදානය වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) වර්ෂ 2005 සිට 2016 දක්වා එක් එක් වර්ෂය සඳහා පොහොර සහනාධාරය වෙනුවෙන් රජය විසින් දරන ලද වියදම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) 2015 වර්ෂයේදී පොහොර සහනාධාර සඳහා වෙන් කළ රු. මිලියන 35,000ක මුදලින් සහ 2016 දී වෙන් කළ රු. මිලියන 37,500ක මුදලින් ඉතිරි කර ගත් මුදල් ප්‍රමාණයක් වේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම පිළිබඳ දැනුම්දීම

1.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අපරාධ වැළැක්වීමේ (සංශෝධන),— (22 වන අධිකාරය වූ) අපරාධ වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණය අධිකාරිය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*2.

ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

ශ්‍රී ලංකා තිරසාර සංවර්ධන පනත් කෙටුම්පත — විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2017 මාර්තු 08) [1].

*4.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයාගේ වැටුප් හා දීමනා ප්‍රතිශෝධනය කිරීම,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 41 (ආ) ව්‍යවස්ථාවට හා 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 3 හා 3 (4) වගන්ති ප්‍රකාරව, මානව හිමිකම් ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල දැනුමක් හා ප්‍රායෝගික අත්දැකීම් සහිත පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සේවය කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස වසර තුනක (03) කාලයක් සඳහා 2015.10.30 දින සිට ක්‍රියාත්මක වන පරිදි ජනාධිපතිවරයා විසින් පත්කර ඇති හෙයින්ද;

2015.10.30 දින සිට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස කටයුතු කරන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වසර තුනක (03) සේවා කාලයෙන් පසු නැවත සිය නිත්‍ය තනතුරට යාමට අදහස් කරන අතර, මෙම වසර තුනක (03) සේවා කාලය තුළ සියලු දීමනා ඇතුළත් විශ්වවිද්‍යාල වැටුප ඇයට අහිමි වුවහොත් ඇයගේ සේවක ප්‍රතිලාභ කෙරෙහි අහිතකර බලපෑමක් සිදුවන බව ඇය විසින් දන්වා ඇති හෙයින්ද;

ඊට අනුකූලව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ වත්මන් සභාපතිනිය වන ආචාර්ය නෙළුම් දීපිකා උඩගම මහත්මිය වෙත ඇයට පෞද්ගලික වන සේ ඇය සේවය කරන පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ නීති දෙපාර්තමේන්තුවේ අංශාධිපතිනිය ලෙස සියලු දීමනා ඇතුළත් පූර්ණකාලීන කථිකාචාර්ය මාසික වැටුප 2015.10.30 දින සිට ගෙවීමටත්, කොමිෂන් සභාවේ සභාපති තනතුරට හිමි රු.10,000/-ක මාසික දුරකථන දීමනාව, පෞද්ගලික භාවිතයට ද හිමිකම් සහිත නිල වාහනයක් සහ එකී වාහනය සඳහා ඉන්ධන ලීටර් 225ක් හෝ වෙළඳපොලේ පවත්නා ඉන්ධන මිල ගණන්වලට අනුරූපව දීමනාවක් ගෙවීමටත් 2017.06.13 දින අමාත්‍ය මණ්ඩලය අනුමතිය ලබා දී ඇති හෙයින්ද;

ඊට අනුකූලව, 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිනිය වන ආචාර්ය නෙලුම් දීපිකා උඩගම මහත්මිය වෙත රජයේ ඒකාබද්ධ අරමුදලට වැය බරක් වන පරිදි ඉහත සඳහන් මාසික වැටුප හා දීමනා ගෙවීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනත යටතේ නියෝග,— 2008 අංක 35 දරන සමුද්‍ර දූෂණය වැළැක්වීමේ පනතේ 6 වගන්තියේ (ඉ) ඡේදය සහ 21 වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 51 වගන්තිය යටතේ මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2016 දෙසැම්බර් 06 දිනැති අංක 1996/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.06.07 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

*6.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උද්ධර්පන පනත යටතේ නියමය (අංක 1),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ රුසියානු සමූහාණ්ඩුව අතර උද්ධර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 07 දිනැති අංක 2022/27 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා,— උද්ධර්පන පනත යටතේ නියමය (අංක 2),— ජාතික රාජ්‍ය සභාවේ 1977 අංක 8 දරන උද්ධර්පන පනතේ 3 වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ යුක්රේනය අතර උද්ධර්පන ගිවිසුම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා විසින් සාදන ලදුව, 2017 ජූනි 02 දිනැති අංක 2021/47 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*8.

අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා,— පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනතේ 52 වගන්තියේ (1) උපවගන්තිය යටතේ අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මැයි 31 දිනැති අංක 2021/28 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.25 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

ක්‍රීඩා අමාත්‍යතුමා,— ක්‍රීඩා පනත යටතේ නියෝගය,— ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 31 වගන්තිය සමඟ කියවිය යුතු 41 වගන්තිය යටතේ ක්‍රීඩා අමාත්‍යවරයා විසින් ජාතික ක්‍රීඩා සංගම් නියෝග සම්බන්ධයෙන් සාදන ලදුව, 2017 මැයි 05 දිනැති 2017/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.07.26 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*10.

අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*11.

පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*12.

බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම්වලින් සියලු තැනැත්තන් ආරක්ෂා කිරීම් සඳහා වූ ජාත්‍යන්තර සම්මුති පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*13.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*14.

දේශීය ආදායම් පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*15.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.09.06 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.01.26 දින සලකා බලන ලදී.)

*16.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2012),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.03.07 වැනි දින ඉදිරිපත් කරන ලද, 2012.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.03.24 දින සලකා බලන ලදී.)

*17.

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා,— ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2017.05.03 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(ප්‍රවාහන හා සන්නිවේදන ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.26 දින සලකා බලන ලදී.)

*18.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2011),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.12.10 වැනි දින ඉදිරිපත් කරන ලද, 2011.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රාජ්‍ය වැව්ලි සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*19.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.24 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*20.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.01.25 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ලංකා බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*21.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන (2015),— මුදල් නීති පනතේ 35(3) වගන්තිය යටතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2015.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් මහජන බැංකුවේ වාර්ෂික වාර්තාව හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.03 දින සලකා බලන ලදී.)

*22.

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමා,— සී/ස කුරුණෑගල වැව්ලි සමාගමේ වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන (2014),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2017.03.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2014.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද ස්වාධීන විගණකවරුන්ගේ නිරීක්ෂණ ඇතුළත් සී/ස කුරුණෑගල වැව්ලි සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(ආර්ථික සංවර්ධන පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.05.23 දින සලකා බලන ලදී.)

*23.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.07.08 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*24.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1983 අංක 54 දරන ශ්‍රී ජයවර්ධනපුර මහරෝහල් මණ්ඩල පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(C) වගන්තිය යටතේ 2016.07.21 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහලේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*25.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් (2013),— 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික නීතිගත සංස්ථා පනතේ 30(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14(3) වගන්තිය යටතේ 2016.08.11 වැනි දින ඉදිරිපත් කරන ලද, 2013.12.31 වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ වාර්ෂික වාර්තාව හා ගිණුම් අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය හා මානව සුභසාධනය, සමාජ සවිබලගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2017.07.04 දින සලකා බලන ලදී.)

*26.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා,— ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනත යටතේ නියෝග,— 2015 අංක 5 දරන ජාතික ඖෂධ නියාමන අධිකාරිය පනතේ 118 වගන්තිය සමඟ කියවිය යුතු 142 වගන්තිය යටතේ වෛද්‍ය උපකරණ මිල නියම කිරීම සම්බන්ධයෙන් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 පෙබරවාරි 17 දිනැති අංක 2006/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*27.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*28.

බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*29.

ථේරවාදී භික්ෂු කතිකාවත් (ලියාපදිංචි කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*30.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2016 ජූනි 22),— "ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ (5)(අ) ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව මැතිවරණ කොමිෂන් සභාව විසින් 2016 පෙබරවාරි 25 දිනැති අංක 1955/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2016.05.06 දින ඉදිරිපත් කරන ලද, ජනමතවිචාරණයකදී හෝ ඡන්ද විමසීමකට අදාළ කාලසීමාව තුළ විද්‍යුත් හා මුද්‍රිත ජනමාධ්‍ය විසින් පිළිපැදිය යුතු උපමාන හෙවත් මාර්ගෝපදේශ/ මෙහෙයුම් ප්‍රතිපත්ති අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*31.

අධිකරණ අමාත්‍යතුමා සහ බුද්ධශාසන අමාත්‍යතුමා,— අධිකරණ සංවිධාන පනත යටතේ නියෝගය,— 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 60 වගන්තිය සමඟ කියවිය යුතු එම පනතේ 61 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2017 මාර්තු 27 දිනැති අංක 2012/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2017.05.23 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

32.

ශ්‍රී ලංකා සේවා පිරිස් කළමනාකරණ ආයතනය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

33.

ළමා පුනරුත්ථාපන කේන්ද්‍රය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

34.

ශ්‍රී ලංකා එක්සත් ක්‍රිස්තියානි සහෝදරත්වය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

35.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

36.

මොනරාගල දිස්ත්‍රික් කාන්තා මහා සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

37.

ලසාලියන් සමාජයීය අධ්‍යාපන සේවාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

38.

ජාත්‍යන්තර කාන්තා සහ ළමා අයිතීන් සුරැකීමේ සභාව (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---